දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 08/2019

PH/CF/CA/2/BUDGET/MGT/2019/ Vol.II,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2019-05-03

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම අධ්‍යක්ෂවරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්,

සියළුම අංශ ප්‍රධානීන්.

**2019 අයවැය - ප්‍රතිපාදන උපයෝජනය හා වියදම් කළමනාකරණය.**

ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාව හා 2019 අංක 06 දරන විසර්ජන පනතෙහි විධිවිධාන ප්‍රකාරව මේ වන විට 2019 වර්ෂයට අදාල වියදම් වෙනුවෙන් වන 2019 අංක 02 දරන සාමාන්‍ය පොදු සේවා වොරන්ට් බලපත්‍රය හා 2019 අංක 2 දරන අත්තිකාරම් බලපත්‍රය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමන් විසින් අත්සන් කිරීමෙන් අනතුරුව එම අමාත්‍යාංශය මගින් අයවැය චක්‍රලේඛ අංක 03/2019 යටතේ ප්‍රසිද්ධියට පත්කොට ඇත. එහි පිටපතක් මේ සමග ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කෙරේ. ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ වන මූලස්ථානය හා ඊට අනුබද්ධ උප බන්ධනාගාර ආයතනයන්ගේ වියදම් කටයුතු වෙනුවෙන් අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ඔබ වෙත වෙන් කර දීමට කටයුතු කරනු ලැබේ. මේ වන විටත් මු.රෙ 135 යටතේ වන වියදම් දැරීම සඳහා වන අධිකාරි බලය පැවරීම, දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2019 යටතේ සිදු කොට ඇත. ඒ අනුව සියළුම ගෙවීම් ඒකක හෙවත් උප බන්ධනාගාර ආයතන විසින් තම ආයතනයන්ට අදාල ගෙවීම් කටයුතු සිදු කල යුතු වේ.

02. 2019 වර්ෂයට අදාලව ඔබ ආයතනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නිකුත් කරනු ලබන අතර සියළුම වැය විෂයන් සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපදන එමගින් සලසා දෙනු ලැබේ. මෙම වර්ෂය තුල ඔබ ආයතනයෙහි ප්‍රතිපාදන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරන අතර වර්ෂය පුරාවට පවතින සියළු වියදම් අදාල අයවැය ප්‍රතිපාදන සීමාව තුල කළමනාකරණය කර ගැනීමට කටයුතු කල යුතුවේ. එමෙන්ම වෙන්කර දී ඇති ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමකින් උපයෝජනය කිරීම මගින් මනා කාර්ය සාධනයක් අත්පත් කර ගැනීමට, අදාල සියළුම වියදම් ඒකක භාර මාණ්ඩලික නිලධාරීන් වගකීමට බැඳෙනු ඇත.

03. පසුගිය වර්ෂයේ සිට රාජ්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය නවතම ක්‍රමවේදයක් යටතේ සිදු කිරීමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරමින් පවතින අතර ඊට සමගාමීව ITMIS හා NEW CIGAS යන මෘදුකාංග හඳුන්වා දී ඇත. මෙම පරිගණකගත මෘදුකාංගය භාවිතය මගින් ගිණුම් තොරතුරු මාසිකව, භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම මේ වන

විටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආරම්භ කර පසුගිය වසර පුරාවට සිදු කර ඇත. මෙම වසරේදී භාවිතා කෙරෙන වැය බාණ්ඩ පිළිබඳ තොරතුරු වසර මුලදී CIGAS වැඩ සටහන මගින් ලබා දීමට මේ වන විටත් කටයුතු කර ඇත. ඒ යටතේ මාසිකව සිදු කරණු ලබන ගිණුම් කටයුතු තාත්වික හා නිවැරදි අයුරින් ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුවේ.

04. මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම වියදමක් සඳහාම බැඳීම් ඇතිකර ගැනීමට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන ඇති බව, ඒ ඒ වියදම් ඒකක භාර නිලධාරීන් පෞද්ගලිකවම තහවුරු කරගත යුතුවේ. තවද 2019 වසර සඳහා වන ප්‍රතිපාදන කාර්තු හතරක් වශයෙන් බෙදා වෙන් කර ගැනීමෙන් අනතුරුව භාවිතා කිරිමට සැලසුම් කරගත යුතුය. එමෙන්ම වර්ෂය තුල ජලය, විදුලිය, ඉන්ධන, අතිකාල වැනි වියදම් අරපිරිමැස්මෙන් යුතුව සිදු කිරිමටත්, අදාල වියදම් මනා කළමනාකරණයකින් යුතුව සිදු කිරිමටත් සියළුම වියදම් ඒකක භාරව කටයුතු කරනු ලබන නිලධාරීන් වග බලා ගත යුතු බව අවධාරණය කරමි.

05. 2019 අංක 6 දරණ විසර්ජන පනත සකස් කර ඇත්තේ අතුරු සම්මත ගිණුම මගින් වෙන් කරන ලද වියදම්ද ආවරණය වන පරිදි බැවින් විසර්ජන පනත සම්මත වීමෙන් අනතුරුව අතුරු සම්මත ගිණුම අහෝසි වනු ඇත. ඒ අනුව මේ වන තෙක් ඔබ විසින් අතුරු සම්මත ගිණුම යටතේ දරන ලද වියදම් 2019 වර්ෂයේ වියදම් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

06. බන්ධනාගාර මූලස්ථානයේ සැලසුම්, සැපයුම්, ඉංජිනේරු, පුනරුත්ථාපන යන අංශ මගින් පාලනය කරනු ලබන වැය විෂයන් සඳහා සමස්ථ වර්ෂයම ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලසුම් සකස් කොට ඉදිරි කටයුතු කිරිම සිදු කල යුතු අතර මේ වන විට 2019 වර්ෂයේ එක් කාර්තුවක් අවසන් වී ඇති බැවින් 2019 වර්ෂයේ අතුරු සම්මත ගිණුම යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මුල් මාස 04 වෙනුවෙන් වැයකලා සේ සලකා ඉතිරි මාස 08 ද ඇතුලත් කොට සමස්ථ වර්ෂයම ආවරණය වන පරිදි 2019 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කල යුතුවේ.

07. 2019 වර්ෂයේ විසර්ජන පනත මගින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති අඹේපුස්ස කඳවුර හා වීරවිල කඳවුර යන ස්ථානයන්හි ස්ථාපිත කිරිමට යෝජිත කිබුත්ස් ගොවිපල ක්‍රමය සම්බන්ධ ව්‍යාපෘතිය හා දොම්පේ ප්‍රදේශයේ කාන්තා රැඳවියන් වෙනුවෙන් වූ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම යන ව්‍යාපෘති ද්විත්වය ක්‍රියාත්මක කිරිම සඳහා භාණ්ඩාගාරය හා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමග සම්බන්ධ වී ඉදිරි කටයුතු මූලස්ථාන සැලසුම් අංශය මගින් සිදු කල යුතු වේ.

08. මෙම චක්‍රලේඛය සම්බන්ධ පැහැදිලි කර ගැනීමක් වෙතොත් මූලස්ථාන මධ්‍යම ගිණුම් ශාඛාව (දුරකථන අංක 011-4677199/011-4677125) වෙතින් ලබාගත හැක.

ටී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

ටී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත:- 01. විගණන අධිකාරි (රජයේ විගණන අංශය) - දැ.ගැ.පි

02. බන්ධනාගාර කොමසාරිස් (ප්‍රධාන අභ්‍යන්තර විගණක) - අ.ක.ස

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බඩ/සි.ඝ.ර /4/1/16-2019

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.04.08

අයවැය චක්‍රලේඛ 03/2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

## 2019 අයවැය - වියදම් දැරීම සඳහා බලය දීම

2019 වර්ෂය ආරම්භයේදී විසර්ජන පනතක් සම්මතව නොතිබූ හෙයින් විසර්ජන පනතක් සම්මත වනතුරු 2019.04.30 දක්වා කාලය තුළ වියදම් දැරීම සඳහා අතුරු සම්මත ගිණුම -2019 මගින් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගන්නා ලදී.

02. අතුරු සම්මත ගිණුමේ ඇතුළත් වූ වියදම් ද ආවරණය වන පරිදි 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත 2019.04.05 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි (2019 අංක 6 දරණ විසර්ජන පනත). ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, විසර්ජන පනතට අදාළ වූ අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් ප්‍රතිපාදන සම්බන්ධයෙන් වියදම් දැරීම සඳහා අදාළ අධිකාරී බලපත්‍ර ගරු මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් කර ඇත.

03. ඒ අනුව 2019 මුදල් වර්ෂයට අදාළ ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතුය.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2019 අංක 2 දරණ සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

(ආ) විශේෂ නීති කටයුතු සඳහා - 2019 අංක 2 දරණ විශේෂ නීති අධිකාරී බලපත්‍රය

(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2019 අංක 2 දරණ අත්තිකාරම් බලපත්‍රය

04. 2019.03.28 දින පැවති 2019 අයවැය කාරක සභා විවාදයේදී සම්මත නොවූ වැය ශීර්ෂ වන 260-279, 312-319 සහ 321 ද, වැය ශීර්ෂ 162 සහ 311 ට අදාළව පසුව ඉදිරිපත් කරන ලද පරිපූරක වියදම් ඇස්තමේන්තු 2019.04.05 දින පාර්ලිමේන්තුවේදී අනුමත වී ඇති බැවින් එයට අදාළ වොරන්ට් බලපත්‍රද ගරු මුදල් අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, එයට අදාළ විස්තර අභ්‍යන්තර,

ස්වදේශ කටයුතු සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරුන් වෙත වෙනම එවීමට කටයුතු කරමි.

05. අතුරු සම්මත ගිණුම අහෝසි වීම

2019 විසර්ජන පනත සකස් කර ඇත්තේ අතුරු සම්මත ගිණුම මගින් වෙන් කරන ලද වියදම්ද ආවරණය වන පරිදි වන බැවින් විසර්ජන පනත සම්මත වීමෙන් අනතුරුව අතුරු සම්මත ගිණුම අහෝසි වනු ඇත. ඒ අනුව 2019 මුදල් වර්ෂය සඳහා ගිණුම් කටයුතු සිදුකල යුත්තේ 2019 අංක 6 දරණ විසර්ජන පනතේ ආකාරයට වේ. එසේම, අතුරු සම්මත ගිණුමේ ඇතුලත්ව ඇති ඇතැම් වැය ශිර්ෂ වලට අදාල විෂය පථයන් පසුව නිකුත් කරන ලද ගැසට් නිවේදන කිපයක් මගින් සංශෝධනය වී ඇත. ඒ අනුව, 2019 අංක 6 දරණ විසර්ජන පනත සකස් කර ඇත්තේ එම සංශෝධනද ඇතුළත් වන පරිදිය.

එබැවින්, මේ සමග ඇති ඇමුණුම 1 හි, 7 වන තීරුවේ සඳහන් වැය විෂයය විස්තරයන් යටතේ අතුරු සම්මත ගිණුමේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන මේ දක්වා දරණ ලද වියදම් එම ඇමුණුමේ 5 වන තීරුවේ දැක්වෙන පරිදි 4 වන තීරුවේ සඳහන් නව අමාත්‍යාංශ යටතේ ගිණුම්ගත කළයුතු වේ (ඒ සඳහා ජනවාරි මස සිට මේ දක්වා වියදම් වාර්තා කළ වැය විෂයයන් අඩිහාර කොට එම වියදම් අදාළ නව වැය ශිර්ෂ යටතේ අදාළ වැය විෂයය විස්තරයට හර කළයුතු වේ). තවදුරටත් සිදුකල යුතු යම් වෙනසක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ ආයතනය සම්බන්ධයෙන් වගකිම දරණ නිලධාරියා විමසා සුදුසු පරිදි ක්‍රියාකල යුතුවේ.

06. 2019 අයවැය ක්‍රියාත්මක කිරීම

2019 වියදම් ඇස්තමේන්තු සකස් කර ඇත්තේ රජයේ ආදායම් හා සාර්ව ආර්ථික රාමුව තුළ දැරිය හැකි වන වියදම් සීමාවන් පිළිබඳව දැඩි ලෙස අවධානය යොමුකර බැවින්, සියළු ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් තම වියදම් අනුමත වියදම් සීමාවන් ඇතුළත සැලසුම් කරගත යුතු බව තරයේ අවධාරණය කරමි. එසේම, 2019 අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත්ව නැති කිසිදු වියදමක් සම්බන්ධයෙන් අමතර ප්‍රතිපාදන ලබාගැනීමේ අරමුණෙන් ගිවිසුම්වලට බැඳීම හෝ කටයුතු සංවිධානය කිරීම තුළින් ඇති වන බැරකම් සඳහා මහා භාණ්ඩාගාරය කිසිදු වගකීමකට බැඳී නොසිටින බවද අවධාරණය කරමි.

විශේෂයෙන් විනිමය අනුපාතයන් කෙරෙහි එල්ල වී ඇති අහිතකර තත්ත්වයන්ද සලකා බලා විදේශ සංචාර /අධ්‍යයන චාරිකා සම්බන්ධ වියදම් හැකිතාක් අවම කළයුතු අතර, ඒ සඳහා අමතර ප්‍රතිපාදන සඳහා ඉල්ලීම් කිසිවක් ඉදිරිපත් නොකළ යුතුය.

07. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

2019 අයවැය යෝජනා සම්බන්ධයෙන් ඒ ඒ අයවැය යෝජනාවට අදාළව ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ප්‍රතිපාදන ලබාදීමට කඩිනමින් කටයුතු කරනු ඇත. මේ වන විටත් මෙම වර්ෂයෙන් සැලකිය යුතු කාලයක් ඉකුත්ව ඇති බැවින් ඉතා කඩිනමින් තම ආයතනය වෙත පැවරෙන අයවැය යෝජනා සම්බන්ධයෙන් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. මෙම යෝජනා සම්බන්ධයෙන් මනා පසුවිපරමක් සහිතව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව තොරතුරු නිරන්තරව යාවත්කාලීන කර පවත්වා ගතයුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී අදාළ ප්‍රගති වාර්තා මහා භාණ්ඩාගාරය වෙත එවිය යුතුය.

08. වගකීම් කළමනාකරණය

මුදල් රෙගුලාසි අනුව වගකීමකට බැඳීමට පෙර අදාළ වියදම සඳහා අයවැය ප්‍රතිපාදන ඇති බවට තහවුරු කරගත යුතුවේ. ඒ පිළිබඳව සියළු ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුවේ. එසේම, ඒ පිළිබඳව තම ප්‍රධානීන් දැනුවත් කිරීම වැය ලෙජරය භාර නිලධාරීන්ගේ ද වගකීම වේ.

09. අත්තිකාරම් ගිණුම් කටයුතු

ස්වකීය අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් ගිණුම් කටයුතු අනුමත සීමාවන්ට යටත්ව පවත්වාගෙන යාමට අදාළ නිලධාරියා වගබලා ගතයුතුය. විශේෂයෙන් උපරිම වියදම් සීමාව වැඩි කිරීම සඳහා අමතර ප්‍රතිපාදන ලබා නොදෙන බව අවධාරණය කෙරේ. එබැවින්, කාලීනව අත්තිකාරම් ගිණුම් පිළිබඳව සමාලෝචනය කිරීමට ගණන්දීමේ නිලධාරීන් වගබලා ගතයුතුය.

10. පැහැදිලි කරගැනීම්

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ ආයතනය සම්බන්ධයෙන් වගකීම් දරන නිලධාරියා විමසන මෙන් කාරුණිකව දන්වමි.

ඒ.ආර්.දේශප්‍රිය
භාණ්ඩාගාර ලේකම් (වැ.බ.)

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති